# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1843/12 – 2013 දෙසැම්බර් 31 වැනි අඟහරුවාදා – 2013.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/කේටීටී/2008/400 හා 2009.01.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘ඒ’ – වරි. අංක 300, ශ්‍රී ජයවර්ධනපුර මාවත – ප්‍රමාණය: හෙක්. 1.2072**
උතුරට: රෝයල් ගාර්ඩන් පාර, ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කොළොන්නාව ඇළ; දකුණට: කොළොන්නාව ඇළ සහ සිමෙන්ති කාණුව; බටහිරට: සිමෙන්ති කාණුව, රෝයල් ගාර්ඩන් සහ කැබලි අක්ෂර බී.

02. **කැබලි අක්ෂර ‘බී’ – වරි. අංක 294, ශ්‍රී ජයවර්ධනපුර මාවත – ප්‍රමාණය: හෙක්. 0.0959**
උතුරට: රෝයල් ගාර්ඩන් පාර සහ ශ්‍රී ජයවර්ධනපුර මාවත; නැගෙනහිරට: ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ; බටහිරට: රෝයල් ගාර්ඩන් පාර සහ කැබලි අක්ෂර ඒ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/10/2013/UDA/275.
2013 නොවැම්බර් මස 07 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, “මිහිකත මැදුර”, ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 - 418